# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/24 - 2020 ඔක්තෝබර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ යටිනුවර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරවරයා විසින් අහෝසි කිරීම හේතුකොටගෙන යටිනුවර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) (අ) වගන්තිය යටතේ යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 05 දොඩම්වල කොට්ඨාසයට තේරී පත් වූ අමුකොටුවේ ගෙදර සපුමල් දේශප්‍රිය අමුකොටුව අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත් කරගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 05 දොඩම්වල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා හේවා බඹරැන්දගේ අනුරුද්ධ ශාන්ත බණ්ඩාර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

යටිනුවර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් හේවා බඹරැන්දගේ අනුරුද්ධ ශාන්ත බණ්ඩාර යටිනුවර ප්‍රාදේශීය සභාවේ අංක 05 දොඩම්වල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,<br>
තේරීම්භාර නිලධාරි,<br>
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
මහනුවර.

10 - 1134


1A - G 33113— 30 (2020/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*